# 3 ශ්‍රේණිය

# සිංහල



**නිපුණතාවය :-** L1, S1, R1, W1

**පවසන දෙයට සවන් දීම**.

1. දී ඇති කොටුවේ මැද ගසක් අඳින්න.
2. ගහට පහතින් වෙල්යායක් අඳින්න.
3. ගසට පැත්තකින් ගෙයක් අඳින්න.
4. ගහට උඩින් ඉර පායා එන ආකාරය අඳින්න.
5. කුරුල්ලන් පියාඹනවා අඳින්න.
6. අඳින චිත්‍රය ලස්සනට පාට කරන්න.

**නිපුණතාව :-** R1 W1 **සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. පිලි රහිත අකුරු ලිවීම.**

**දුවේ පුතේ පහත අකුරු දී ඇති ප්‍රමාණයට ද හිස් රූලේ ලියන්න.**

**<u>මධ්‍ය අක්‍ෂර</u>**

ඍ ඎ ක ග ඝ ඟ

ත න ජ ය හ ශ

ෂ ස ඞ ල අං අඃ

**<u>ආරෝහණ අක්‍ෂර</u>**

ඉ එ ඒ ඓ ඔ ඕ

ඖ ධ ඨ ඪ ඡ ඦ

ඤ ඣ ට ඩ ඬ ඳ

ණ ඞ ට ධ ඩ බ

ම ඹ ර ව ඪ

**<u>අවරෝහණ අක්ෂර</u>**

අ ආ ඇ ඈ ඉ උ

ඌ ඍ ද ඳ ල ළ

ඎ

**දුවේ, පුතේ පහත එක් එක් වචනය තනිරූල් මත ලියන්න.**

| | | | |
|---|---|---|---|
| අභයපුර | ආසනය | ඊතණ | ඉදල |
| ඝනකය | හටයා | කමත් | දඹල |
| ඒනවා | කමත | ඖෂධ | ඇළ |

1.

2.

3.

4.

5.

6.

- **පිලි සහිත වාක්‍ය ලියමු දුවේ, පුතේ.**

1. අහස ආසන්නයේ ම ඇත.

2. ඉර උදේ කන්ද උඩින් පායනවා.

3. විලේ ලස්සන නෙලුම් මල් පිපෙනවා.

4. රණවිරුවෝ අපේ රට රකිති.

5. තැඹිලි වතුර අමෘතය මෙන් රසවත් ය.



R1 කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.

W1 සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.




**ා** ඇලපිල්ල

**ආ ශබ්දය**



මාලය



තාරාවා



පාලම

**මුල් අකුරට ඇලපිල්ල ( ා ) යොදා ලියමු.**

**ා**

මල → මාල

ගල → 

තල → 

දර → 


තර → 





## ැ කෙටි ඇදපිල්ල

➤ දුවේ පුතේ ඔබත් කියවමු. මල්ලේ ඇති ඇ ශබ්දය ( ැ ) වචන රතු පාටින් රවුම් කරමු.




කැටය

වැල

සැර

මැද

පැන්සල

පැල



## ෑ දික් ඇදපිල්ල

**ඈ ශබ්දය**



බෑගය




කෑරලා



තෑග්ග

දුවේ, පුතේ වචන හදමු. ලියමු.

| | | | |
|---|---|---|---|
| ඇ — පෑ | → |  | ..................................... |
| ඇ — තෑ | → |  | ..................................... |
| ඇ — දෑ | → |  | ..................................... |
| ඇ — බෑ | → |  | ..................................... |

➤ දුවේ, පුතේ පහත වචන වල මුල් අකුරට ( **ඇ** ) යොදා ඉදිරියෙන් නැවත ලියමු.

අත ⟶ ඇත

දත ⟶ ..................

රට ⟶ ..................

සය ⟶ ..................

පන ⟶ ..................

මත ⟶ ..................

➤ **"ඇ"** ශබ්දය යෙදෙන වචන සහිත වාක්‍ය කියවමු. බලා ලියමු.

1. <u>කෑරලා</u> කැලයට යනවා.

   ..........................................................................................................

2. <u>පෑන</u> බෑගයට දමන්න.

   ..........................................................................................................

3. අක්කා <u>මෑ කරල්</u> කඩනවා.

   ..........................................................................................................

## කෙටි ඉස්පිල්ල




## ඉ ශබ්දය

පිල සිල් තිහ නියන

පිනි සිත නියර

- දුවේ, පුතේ කෙටි ඉස්පිල්ල සහිත වචන නිල් පාටින් පාට කරමු.




- පහත අකුරු වලින් පටන් ගන්නා වචන ලියමු, කියවමු.

සි - සිත

බි - ........................

කි - ........................

පි - ........................

දි - ........................

➤ පහත වාක්‍ය බලා ලියමු. කියවමු.

1. මිතිලා මී කිරි කෑවා

..........................................................................................................

2. සිරිපාල සීයාට වැන්දා

..........................................................................................................

3. අම්මා පූසාට කිරි දෙයි.

..........................................................................................................

**ී දික් ඉස්පිල්ල**



**ඊ ශබ්දය**

➤ දුවේ, පුතේ කියවමු.

සත ⟶ සීත

කර ⟶ කීර

ගතය ⟶ ගීතය

ලය ⟶ ලීය

➤ පහත අකුරු වලින් පටන් ගන්නා වචන ලියමු, කියවමු.

| | |
|---|---|
| සී ⟶ සීත | පී ⟶ ................ |
| බී ⟶ ................ | දී ⟶ ................ |
| කී ⟶ ................ | ගී ⟶ ................ |

➢ පහත වාක්‍ය බලා ලියමු. කියවමු.

1. විමලා **<u>වී</u>** එකතු කළා.

..........................................................................................

2. බිනර **<u>බීම</u>** බිව්වා.


..........................................................................................


3. සිරිපාල **<u>සීයාට</u>** වැන්දා.


..........................................................................................


4. නිමල් **<u>ගීතයක්</u>** ගායනා කළා.

..........................................................................................




 කෙටි කොන් පාපිල්ල

 කෙටි වක් පාපිල්ල

 කෙටි ඇද පාපිල්ල

➢ දුවේ, පුතේ මේ වචන කියවමු.

| | | |
|---|---|---|
| පුටුව | කුඩය | රුක |
| දුවන | ගුහාව | රුවල |
| සුළඟ | තුන | තරුව |

➢ ප්‍රහේළිකා පුරවමු.





| | | |
|---|---|---|
| | ඩ | ය |
| ල් | | |
| ල | | |





| | | | |
|---|---|---|---|
| | පි | ය | ල |
| ව | | | |
| ල | | | |





| | | |
|---|---|---|
| | ටු | ව |
| ල් | | |
| ල | | |

➢ පහත වැකි බලා ලියමු. කියවමු.

1. සුමුදු **<u>රුපියල</u>** ගත්තා.

   ..........................................................................................................

2. අක්කා **<u>කුඩය</u>** ඉහළනවා.

   ..........................................................................................................

3. අම්මා **<u>පුහුල්</u>** උයනවා.

   ..........................................................................................................

| ූ ූ ූ | දික් පාපිල්ල |
|---|---|



## උ ශබ්දය

### කියවමු.

| ූ | දික් කොන් පාපිල්ල | ූ | දික් වක් පාපිල්ල | ූ | දික් ඇද පාපිල්ල |
|---|---|---|---|---|---|

| | | |
|---|---|---|
| **පූසා** | කූඩය | රූපය |
| සූකිරි | තූර්යා | රූකඩ |
| දූවිලි | ගූගල් | **රූපා** |

➤ දුවේ, පුතේ වචන වෙන් කර ලියමු.

| | | | |
|---|---|---|---|
| පූසා | කූඩැල්ලා | දූපත | කූඩය |
| සූකිරි | රූකඩ | මූඩිය | තූර්යා |
| පූජාව | රූපය | සූදුරු | කූඩුව |

| ූ | ූ | ූ |
|---|---|---|
| | | |

වාක්‍ය බලා ලියමු.

1. කුමාරි **<u>කූඩයක්</u>** ගත්තා.

..........................................................................................

2. නිපුනි **<u>දූපතක්</u>** දුටුවා.


..........................................................................................



**ෙ** **කොම්බුව**

**එ ශබ්දය**

දුවේ, පුතේ **ෙ** යෙදෙන වචන රතු පාටින් කොටු කරමු.



➤ දී ඇති අකුරෙන් පටන් ගන්නා වචන ලියමු. කියවමු.

| | | | |
|---|---|---|---|
| කෙ | - ........................ | මෙ | - ........................ |
| බෙ | - ........................ | දෙ | - ........................ |
| පෙ | - ........................ | හෙ | - ........................ |
| සෙ | - ........................ | නෙ | - ........................ |

➤ වාක්‍ය බලා ලියමු. කියවමු.

1. අපි **<u>හෙට ගෙදර</u>** යමු.

   ..........................................................................................

2. අලියා **<u>කෙසෙල්</u>** කයි.

   ..........................................................................................



**ෙ ් ් කොම්බුව සහිත හල් කිරීම**

**ඒ ශබ්දය**

## කියවමු

| **ෙ ්** | **ෙ ්** |
|---|---|
| **ලේනා** | **වේයා** |
| **හේන** | **මේසය** |
| **පේර** | **ඩේලියා** |

➢ වචන වෙන්කර ලියමු.

| | | |
|---|---|---|
| බේසම | තේක්ක | දේවාලය |
| කේතලය | වේයා | ලේනා |
| නේපාලය | මේසය | වේවැල් |
| සේයාට | ඩේලියා | |

ෙ ්

ෙ ්

➢ දී ඇති අකුරෙන් පටන් ගන්නා වචන ලියමු. කියවමු.

කේ - ..........................  සේ - ..........................

බේ - ..........................  හේ - ..........................

පේ - ..........................  මේ - ..........................



ෙ ා  **කොම්බුව සහිත ඇලපිල්ල**

**ඹ ශබ්දය**

## කියවමු.

| | |
|---|---|
| දොර | ලොකු |
| **මොර** | **කොස්ස** |
| ගොරකා | තොටියා |

## ➢ හිස්තැන් පුරවමු.

1). ................ රණ　　　　2). ..................... නරා

3). ................. වි　　　　4). .................... ර

5). ................. ස්ස　　　　6). .................... ත්තම

(බො , මො , ලො , තො , දො , කො )

## ➢ පහත අකුරු මුලට යෙදෙන වචන ලියමු.

| | | | |
|---|---|---|---|
| පො | - ...................... | රො | - ...................... |
| කො | - ...................... | දො | - ...................... |
| තො | - ...................... | බො | - ...................... |
| ලො | - ...................... | ගො | - ...................... |
| සො | - ...................... | මො | - ...................... |



➤ ො යෙදෙන ඕ ශබ්දය සහිත වචන පෙළ පොතෙන් සොයා ලියමු.

ෝ කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීම

ඕ ශබ්දය



➤ ො ෝ වචන වෙන්කර ලියමු. කියවමු.

කොටස
දොර
පොළ
තොරණ
බෝතල
ලොවි
පෝළිම
මෝල
බෝලය
ලෝකය
නෝනා
ගොම

ො ඔ ශබ්දය

ෝ ඕ ශබ්දය

➤ වචන ලියමු.

පෝ - .......................
ලෝ - .......................

කෝ - .......................
සෝ - .......................

තෝ - .......................
දෝ - .......................

ගෝ - .......................


# සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.

## ගැට ඇලපිල්ල


➤ ''සෘ'' ශබ්දය යෙදෙන වචන කියවමු.



ගෘහය



වෘක්ෂය



වෘත්තය

| | | |
|---|---|---|
| මෘදු | ගෘහය | පෘථිවිය |
| කෘතිය | දෘශ්‍ය | වෘත්තය |
| තෘණ | හෘදය | |

➤ ඉහත කොටුව බලා හිස්තැන් පුරවමු.

1). ...................... දු
4). ...................... හය

2). ...................... ණ
5). ...................... තිය

3). ...................... ත්තය
6). ...................... ථිවිය

## කියවමු බලා ලියමු.

1. තෘණ භූමිය මැද ගෘහයක් තිබෙනවා.

   ..........................................................................................

2. රෝගියාගේ හෘදය දුර්වල වෙලා.

   ..........................................................................................

3. වෘක්ෂයේ බොහෝ පක්ෂීන් ඉන්නවා.

   ..........................................................................................

4. වෘකයා දුවගොස් කුඩා සත්තු අල්ලා ගත්තා.

   ..........................................................................................

5. හැකි සෑම විටම හොඳ කෘති කියවන්න.

   ..........................................................................................

# ගැට ඇලපිලි දෙක

## දුවේ, පුතේ "ඎ" ශබ්දය යෙදෙන වචන කියවමු.

| | |
|---|---|
| බෲස්ලි | බෲනායි |
| කෲසෝ | ගෲෂා |

දී ඇති අකුරට ගැට ඇලපිලි දෙක යොදා ලියන්න.

| | | |
|---|---|---|
| ත - .................. | ව - .................. | ග - .................. |
| ප - .................. | ද - .................. | ක - .................. |
| බ - .................. | ම - .................. | |

**➤ පෙර කොටුවේ වචනවලින් බලා ලියමු කියවමු.**

| | |
|---|---|
| 1). .................... නායි | 3). .................... සෝ |
| 2). .................... ස්ලි | 4). .................... ෂා |

**➤ කියවමු, ලියමු.**

1. බෲස්ලි දක්ෂ සටන් ශිල්පියෙකි.

   ............................................................................................

2. ගෲෂා කැඩුණු පාලමකින් එගොඩට ගියා.

   ............................................................................................

3. කුසගිනි වූ ඇන්ඩෲ ඉඳගෙන බලා සිටියි.

   ............................................................................................

**➤ මෙවැනි ගැට ඇලපිලි දෙක යෙදෙන වචන සොයා ලියමු.**

## කොම්බු දෙක (ඓ ශබ්දය)

**➤ දුවේ, පුතේ මේ වචන ශබ්ද නගා කියවමු.**

| | |
|---|---|
| දෛවය | ධෛර්ය |
| මෛත්‍රිය | වෛද්‍ය |
| චෛත්‍යය | තෛලය |
| ශෛල | වෛරය |



- **කොටුව තුළ ඇති වචන බලා හිස්තැන් පුරවමු.**

1). .................. වය
2). .................. රය
3). .................. ත්‍රිය
4). .................. ද්‍ය
5). .................. ත්‍යය
6). .................. ලය
7). .................. ල
8). .................. ර්‍ය

- **පහත වාක්‍ය කියවමු බලා ලියමු.**

1. මෛත්‍රී භාවනාව උසස් භාවනාවකි.

..............................................................................................

2. කිසිදා වෛරයෙන් වෛරය නොසන්සිදේ.

..............................................................................................

3. චෛත්‍යය සුදෝ සුදු පැහැයෙන් බබළයි.

..............................................................................................

4. වෛද්‍යවරයා රෝගියාට ප්‍රතිකාර කළේය.

..............................................................................................

3. දෛව්‍ය වෙනස් කළ නොහැකි යැයි සමහරු කියති.

..............................................................................................



# කොම්බුව සහ ගයනු කිත්ත

## ඖ ශබ්දය

➤ **දුවේ, පුතේ උදව් ලබාගෙන මේ වචන කියවන්න.**



| | |
|---|---|
| භෞතික | බෞද්ධ |
| කෞශල්‍ය | ගෞරවය |
| නෞකාව | සෞභාග්‍යය |
| ලෞකික | සෞන්දර්ය |

➤ **ඉහත කොටුවෙන් බලා ලියමු. කියවමු.**

1). ................. තික

2). ................. ද්ධ

3). ................. කික

4). ................. භාග්‍යය

5). ................. ශල්‍ය

6). ................. න්දර්ය

7). ................. රවය

8). ................. කාව

➤ **බලා ලියමු.**

1. චිත්‍ර සෞන්දර්ය විෂයයකි.

   ..........................................................................................

2. කෞෂික මගේ මිතුරෙකි.

   ..........................................................................................

3. නගරයේ පෞද්ගලික රෝහලක් ඇත.

   ..........................................................................................

4. අපි වැඩිහිටියන්ට ගෞරව කරමු.

.............................................................................................................

5. නෞකාව වරායට පැමිණියා.

.............................................................................................................

➤ **දුවේ, පුතේ, පහත අකුරු වලින් පටන් වචන ලියමු.**

| | |
|---|---|
| ම – | ස – |
| මා – | සා – |
| මැ – | සැ – |
| මෑ – | සෑ – |
| මි – | සි – |
| මී – | සී – |
| මු – | සු – |
| මූ – | සූ – |
| මෙ – | සෙ – |
| මේ – | සේ – |
| මො – | සො – |
| මෝ – | |
| ස – | සෝ – |

ඪා –

ඪැ –

ඪෑ –

ඪි –

ඪී –

ඪු –

ඪූ –

ඪෙ –

ඪෝ –

## විරාම ලකුණු හඳුනා ගනිමු.

### තිත – නැවතීමේ ලකුණ ●

පහත ඡේදය කියවමු.

'' හාවාත්, ඉත්තෑවත් එකවර නතර වූහ. වෘකයා දත් මිටි කෑවේ ය. තොල කට ලෙව කෑවේය. ''ඉත්තෑවෝ, මම උඹට අත තියන්නේ නෑ. උඹේ කූරු තියෙන නිසා. ඒත් පිනුම් අප්පු මම උඹ සම්පූර්ණයෙන් ම ගිලිනවා. වෘකයා ගිගිරුවේ ය. හාවා බියෙන් වෙවුලන්නට විය. උගේ ඇඟ සියුමැලි විය. කකුල මහ පොළොවට ඇලුනාක් මෙන් දැනෙන්නට විය.

ඉහත ඡේදයේ නැවතීමේ තිත කොටු කරන්න. ●

➤ **වචන හා වාක්‍ය කියවමු, ලියමු පුතේ.**

1. අලියා විශාල සතෙකි.
2. සුළඟට ගස් සෙලවුණා.
3. කන්ද උඩින් ඉර පායනවා.

➤ **දුවේ, පුතේ නැවතීමේ තිත තබා වාක්‍ය නැවත ලියමු.**

1. බටහිර අහසෙන් ඉර බැස ගියේ ය

   .............................................................................................................

2. අම්මා රෙදි සෝදයි

   .............................................................................................................

3. ගුරුතුමිය අකුරු උගන්වයි

   .............................................................................................................

## ප්‍රශ්නාර්ථ ලකුණ ?

➤ **ප්‍රශ්න අසන වාක්‍යවල අගට ප්‍රශ්නාර්ථ ලකුණ ? යෙදේ.**

➤ **දුවේ පුතේ පහත වාක්‍ය කියවමු.**

1. ඔබ හෙට ගෙදර  ඉන්නවා ද?
2. මම ඔබට උදවු කරන්න ද?
3. තාත්තා උදෙන් ම රැකියාවට ගියා ද?
4. අපි ගෙදර යමු ද?
5. නංගී මල් කැඩුවා ද?

➤ **දුවේ, පුතේ පහත වාක්‍ය ප්‍රශ්නාර්ථ ලකුණ යොදා නැවත ලියන්න.**

1. අම්මා මගේ ඇඳුම් මැද්දා ද

.....................................................................................................

2. මල්ලි පාඩම් කළා ද

.....................................................................................................

3. මම ඔබට උදවු කරන්න ද

.....................................................................................................

4. තාත්තා අද උදේ කුඹුරට ගියා ද

.....................................................................................................

5. සමහර මල් රෑට පිපෙන්නේ ඇයි

.....................................................................................................

➤ **ප්‍රශ්නාර්ථ ලකුණ යෙදෙන වාක්‍ය පෙළ පොතෙන් සොයා ලියන්න.**

## කොමාව ,

➤ **වාක්‍යයක් අවසාන වීමට පෙර තබන විරාමය සඳහා කොමාව යෙදේ.**

➤ **දුවේ, පුතේ කොමාව යෙදෙන අවස්ථා කියවමු.**

1. දරුව , මෙහි එන්න.
2. පුතේ, චිත්‍රය අඳින්න.
3. සාමා, අමර, ශිවාජී, අමිතාබ් ආදි සියලු දෙනාට ඉරිදාවක අපේ නිවසට පැමිණියෝ ය.

➤ **සුදුසු ස්ථානවල කොමාව යොදා ලියන්න.**

1. ආයුබෝවන් සභාවෙන් අවසරයි.

.....................................................................................................

2. මාලා මෙහි එන්න.

............................................................................................

3. පුතා අර පුවත්පත අරගෙන එන්න.

............................................................................................

4. අතුරු පසට කෙසෙල් පේර ජම්බු වැනි පලතුරු ගන්න.

............................................................................................

➤ **මෙවැනි කොමාව යෙදුන වාක්‍ය ලියමු. පෙළ පොතෙන් සොයා ලියමු. කියවමු.**

## යුගල උඩු කොමාව “ ”

➤ **යමකු විසින් කළ ප්‍රකාශයක්, යමකින් උපුටා ගැනීමක් සඳහා වන කොටසක් පෙන්වීමට යුගල උඩු කොමා යෙදේ.**

➤ **දුවේ, පුතේ කියවමු, ලියමු.**

1. ‘‘පුතා අද පාසල් ගියේ නැත්තේ ඇයි?’’ පියා පුතාගෙන් විමසුවේ ය.
2. ‘‘පොත් කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ.’’
3. ‘‘කෝ ඉතිං ඔච්චර දුර ගිහින් ගෙනා ඔටුන්න?’’
4. ‘‘වෙලාවට  වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ.’’
5. ‘‘ඉතිං මෙච්චර පරක්කු වුණේ ඇයි?’’ අම්මා ඇසුවා ය.

➢ **දුවේ, පුතේ පහත වාක්‍ය වලට යුගල උඩුකොමා යොදා** " " **නැවත ලියමු.**

1. ඒ පුතේ අපේ රටේ නිදහස් උත්සවය.

   ..........................................................................................

2. ආයුබෝවන්, සභාවෙන් අවසරයි.

   ..........................................................................................

3. පොත් කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ.

   ..........................................................................................

4. හැමෝම එකට අත් අල්ලාගන්න ගුරුතුමිය කිවුවා.

   ..........................................................................................

5. මම මුලින් ම සීයා වෙන්නම් පවනි කිවුවා.

   ..........................................................................................

**R2 W2 කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි, ලියයි.**

➢ **දුවේ, පුතේ පහත ඡේදය කියවමු, පිළිතුරු ලියමු.**

''ගම ආරක්‍ෂා කරන පවුරක් සේ කන්ද අහස දෙසට විහිදී ඇත. කන්දේ පහළ කොටසේ තැනිත් තැන සරුසාර රබර් වගාවකි. පෙනෙන තෙක් මානයේ විහිදි ඇති වෙල් යාය ගොයම් පැළ නිසා නිල්ල ගැසී ඇත. නියරේ වක්කඩ ළඟට ගිය රම්‍යා තිත්ත පැටවු පොර කන ආකාරය බලා සිටියා ය. ඇළ ඉවුරේ කොටල, ගහල, හා දිය හබරල පඳුරු වැටී ඇත. කෙටල පඳුරු එකිනෙකට ළංව වැටී ඇත්තේ කොරවක්කන්ට සැඟවෙන්නට සෑදු ගෙවල් සේය. කුරුල්ලන්ගේ කීචි බීචි නාදය පරිසරයේ නිහඬ බව බිඳීයි. වෙල් යායේ ඈත කොනකින් එන බට නළා වාදනයක හඬක් සුළඟට මුසු වෙයි.''

1. කන්ද අහස දෙසට විහිදී ඇත්තේ කුමක් සේ ද?

..........................................................................................

2. තිත්ත පැටවුන් පොරකෑවේ කොහි ද?

..........................................................................................

3. සුළඟට මුසු වෙන්නේ කුමක් ද?

..........................................................................................

4. කෙටල පඳුරු ළංව ඇත්තේ කුමක් සේද?

..........................................................................................

**පහත වචන බලා ඉදිරියෙන් ලියමු.**

| | | | |
|---|---|---|---|
| ආරක්ෂා | ........................ | රම්‍යා | ........................ |
| රබර් | ........................ | නියරේ | ........................ |
| වක්කඩ | ............................. | බටනළා | ............................. |
| පවුරක් | ............................. | පහළ | ............................. |

**නිවැරදි වචන ලියා සම්පූර්ණ කරමු.**

1. ගම ආරක්ෂා කරන ........................... (කන්දක් / පවුරක්) සේ කන්ද අහස දෙසට විහිදී ඇත.
2. කන්දේ ............................. (ඉහළ / පහළ) කොටසේ තැනින් තැන සරුසාර .......................... (පොල්/ රබර්) වගාවකි.
3. වෙල් යාය .......................... (රබර් / ගොයම්) පැළ නිසා නිල්ල ගැසී ඇත.

4. නියරේ ............................... (වක්කඩ/ දිය පහර) ළඟට ගිය රම්‍යා එහි තිත්ත පැටවුන් ............................ (දඟලන/ පොරකන) ආකාරය බලා සිටියාය.

5. කුරුල්ලන්ගේ කීචි බීචි නාදය (අවට / පරිසරයේ) නිහඬ බව බිඳියි



**R3 W3 කැමැත්තෙන් හා රසවිඳිමින් ලියයි/ අඳියි.**

## සංවාද



➢ **දුවේ, පුතේ ඉහත රූප යොදා සංවාදයක් ලියමු.**

## චිත්‍ර කතා


➢ **දුවේ, පුතේ චිත්‍ර කතාව සම්පූර්ණ කරන්න.**




**මෙවැනි චිත්‍ර කතා ලබා දී දෙබස් ලිවීමට දෙමු.**

# සමාන පද


➤ **දුවේ, පුතේ සමාන පද කියවමු.**




**ඇස් - නෙත්**



**ගෙදර - ගෘහය**



**වැස්ස - වර්ෂාව**



**ගස - රුක**

➤ **සමාන පද තෝරා ලියමු.**

1. ප්‍රවෘත්තිය ..........................
2. රාත්‍රිය ..........................
3. කැලෑව ..........................
4. ඇස් ..........................
5. දූපත ..........................

| | | | | |
|---|---|---|---|---|
| වනය | රැය | නෙත් | දිවයින | පුවත |

➤ **ඉරි ඇඳි පදවලට සමාන පද යොදා ඒ වාක්‍ය නැවත ලියන්න.**

1. ඒ <u>වනය</u> හරිම ලස්සනයි.

   ..........................................................................................

2. <u>රාත්‍රී අහස</u> සුන්දරයි.

   ..........................................................................................

3. දිනපතා <u>ප්‍රවෘත්ති</u> බලමු.

   ..........................................................................................

4. <u>ඇස්</u> වලින් මුළු ලෝකය දකිමු.

   ..........................................................................................

5. අපි <u>දුපතට</u> ගියෙමු.

..........................................................................................

## විරුද්ධාර්ථ පද

- **දුවේ, පුතේ විරුද්ධ තෝරා ලියමු.**

1. කීකරු - ..........................
2. ප්‍රශ්න - ..........................
3. ගැළපෙන - .........................
4. සෙමෙන් - .........................
5. පුරුදු - .........................

| | | | | |
|---|---|---|---|---|
| නුපුරුදු | වේගයෙන් | පිළිතුරු | අකීකරු | නොගැළපෙන |

- **වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවමු.**

1. අශ්වයා ....................................... දුවයන සතෙකි.

   ඉබ්බා ...................................... ගමන් කරයි.

   (සෙමින්/ වේගයෙන්)

2. ආගමික ස්ථානවලට යන විට ................................... ඇඳුම් ඇදිය යුතුය.

   ...................................... ඇඳුම් ඇදීම සුදුසු නැත.

   (ගැළපෙන/ නොගැළපෙන)

3. ගුරුතුමිය ................................... දහයක් සාදයි.

   ළමයි ඒවාට .............................. ලියති.

   (ප්‍රශ්න / පිළිතුරු)

4. හොඳ ළමයි ................................ ය.

   නරක ළමයි ................................. ය.

   (කීකරු / අකීකරු)

# යුගල පද

- යුගලය යනු දෙකකි. එකවර වචන දෙකක්ම යෙදීම යුගල පද වල විශේෂයකි.

➢ **දුවේ, පුතේ පහත යුගල පද කියවමු.**

| | |
|---|---|
| ගමන් | බිමන් |
| අහල | පහල |
| සිරිත් | විරිත් |
| තෑගි | බෝග |
| කෑම | බීම |

➢ **දුවේ, පුතේ හිස්තැන් පුරවමු.**

1. .......................... බිමන්
2. අහල .........................
3. .......................... විරිත්
4. තෑගි ..........................
5. ............................. බීම

➢ **යුගල පද යොදා හිස්තැන් පුරවන්න.**

1. අපි යහළුවන්ට .................................................... දෙමු.
2. අලුත් අවුරුද්දට ....................................... ගෙවල්වලට නෑගම් යනවා.
3. මගුල් ගෙදර .................................................. පිරිලා

4. වාහනවල ................................... යන්න ළමයි හරි කැමතියි.

5. අවුරුදු .......................................... හැමෝම සිද්ධ කරනවා.

(ගමන් -බිමන් / අහල - පහළ / සිරිත් - විරිත් / තෑගි - බෝග / කෑම - බීම)

## ප්‍රස්තාව පිරුළු

➤ **පහත ප්‍රස්තා පිරුළු කියවමු.**

1. ළිඳේ ඉන්න ගෙම්බා වගේ.
    - තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැතිව සිටීම.
2. ඉදිකටුවයි නූලයි වගේ.
    - සෑම විටම තමන් සමඟ තවත් අයෙක් එකට සිටීම.
3. මඩේ හිටවපු ඉන්න වගේ.
    - එක තීරණයක නොසිටීම.
4. ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ.
    - කෙනෙකුගෙන් කෙසේවත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සහා කිරීම.
5. පරංගියා කෝට්ටේ ගියා වගේ.
    - කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යාම.

➤ **දුවේ, පුතේ පහත ප්‍රස්තා පිරුළු සම්පූර්ණ කරන්න.**

1. ............................ කෝට්ටේ ගියා වගේ.
2. මඩේ ....................... ඉන්න වගේ.

3. ................................ පිහාටු ඉල්ලනවා වගේ.

4. ඉඳිකටුවයි ............................. වගේ.

5. ................................ ඉන්න ගෙම්බා වගේ.

(හිටවපු / නූලයි / ළිඳේ / පරංගියා / ඉබ්බාගෙන්)

➢ **දුවේ, පුතේ තේරුමට අදාළ ප්‍රස්තාව පිරුළු ලියන්න.**

1. එක තීරණයක නොසිටීම.

   ..........................................................................................

2. කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යාම.

   ..........................................................................................

3. සෑම විටම තමන් සමග තවත් අයෙක් සිටීම.

   ..........................................................................................

4. කෙනෙකුගෙන් කෙසේවත් ලබා ගැනීමට නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සහා කිරීම.

   ..........................................................................................

5. තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නැතිව සිටීම.

   ..........................................................................................

**R6 W6 සන්නිවේදනය සඳහා කියවයි.**

➤ පහත සුබ පැතුම් පත කියවමු.




සුබ පැතුම්පත ඇසුරින් පිළිතුරු සපයන්න.

1. සුබ පැතුම කුමක් සඳහා ද? ........................................................................
2. සුභ පැතුවේ කාට ද? ........................................................................................
3. මිතුලිගේ උපන්දිනය කවදා ද? ..........................................................................
4. එය ලියා ඇත්තේ කවු ද? ..................................................................................

➤ දුවේ, පුතේ ඔබත් සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

**නිපුණතාව R9 W9** **පහත කවිය ගායනා කරන්න.**

බක්කන් ඔළුවක් දාගෙන
කට ලොකුවට හිනා වෙවී
හැමදාමත් කුඹුර මැද්දේ
ඉන්නේ කොහොමද කියන්න

වැස්ස වහිනකොට ඔයාට
තෙමිලා ලෙඩ වෙන්නේ නැද්ද
ඉර අහසේ මුදුන් වෙද්දි
සෙවනක් ගැන හිතෙන් නැද්ද

➤ **කවියෙන් කියවෙන කෙනා කවුද? නම ලියන්න. චිත්‍රයට නගන්න.**

.............................................................................................................

## තොරතුරු ස්ථාන

- දුවේ පුතේ බදුලු ගමන පාඩම් පෙළ පොතේ කියවමු.

1. ග්‍රහලෝකාගාරය
2. සීගිරිය
3. දළදා මාලිගාව
4. ශ්‍රී පාදස්ථානය
5. ප්‍රදීපාගාරය
6. ශ්‍රී මහා බෝධිය
7. රුවන්වැලි සෑය

- **පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයමු.**

1. දළදා මාලිගාව තිබෙන්නේ කොහේ ද?

   ..........................................................................................

2. එහි තැන්පත් කොට ඇත්තේ මොනවා ද?

   ..........................................................................................

3. දළදා මාලිගාවේ ඇසළ පෙරහැර පැවැත්වෙන්නේ කුමන මාසයේ ද?

   ..........................................................................................

**R10** **සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි.**

## ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග පද

| පුරුෂ ලිංග නාම පද | | ස්ත්‍රී ලිංග නාම පද | |
|---|---|---|---|
| තාත්තා | සීයා | අම්මා | ආච්චි |
| අයියා | තරුණයා | අක්කා | තරුණිය |
| මල්ලි | කොල්ලා | නංගි | කෙල්ල |
| ගිරවා | සොරු | ගිරව් | සෙර |
| ගුරුතුමා | මිතුරා | තුරුතුමිය | මිතුරිය |
| කුකුළා | බල්ලා | කිකිළි | බැල්ලි |

➢ ඉරි ඇදි පදයේ ස්ත්‍රී ලිංග නාම පදය ඉහත වගුවෙන් සොයා එම වාක්‍ය නැවත ලියන්න.

1. බල්ලා සතෙකුට බුරනවා.

   ..........................................................................................................

2. කුකුළා කූඩුවට ගියා

   ..........................................................................................................

3. ගුරුතුමා උදෙන්ම පාසලට අවා.

   ..........................................................................................................

4. පොළෙන් මල්ලිට සෙල්ලම් බඩු ගෙනාවා.

   ..........................................................................................................

5. ගිරවා වී කරල් රැගෙන යනවා.

   ..........................................................................................................

6. මගේ මිතුරා හරිම හොඳයි.

   ..........................................................................................................

## ඒක වචන, බහු වචන නාම පද

| ඒක වචන | බහු වචන |
|---|---|
| පොත | පොත් |
| උදැල්ල | උදලු |
| ගොවියා | ගොවියෝ |
| කවියා | කවියෝ |
| පුටුව | පුටු |

➢ දුවේ, පුතේ ඒක වචන  නාම පද වලට බහු වචන නාම පද යොදමු.

| ඒක වචන | බහු වචන |
|---|---|
| අත | ............................... |
| දරුවා | ............................... |
| ගල | ............................... |
| මාර්ගය | ............................... |
| කුඹුර | ............................... |
| සාරිය | ............................... |
| දල්ල | ............................... |

## ක්‍රියා පද

කවුරුන් හෝ කරන දෙයක් සහ ඉබේ සිදු  වන දේවල් හඟවන පද, ක්‍රියා පද ලෙස හැඳින්වේ.

➢ දුවේ, පුතේ සුදුසු ක්‍රියා පද වරහන් තුළින් තොරා වාක්‍ය සම්පූර්ණ කරමු.

1). ඉර අහසේ ..................................................................................

2). ගොවියා කුඹුරට ..........................................................................

3). වලාකුළු අහසේ ..........................................................................

4). ලේනා අඹ ....................................................................................

5). සුළඟින් ගස් ................................................................................

6). ළමයා අකුරු ................................................................................

7). කපුටෝ අහසේ ............................................................................

8). අහසේ තරු ...................................................................................

9). ගුරුතුමා පාසලට ........................................................................

10). එළදෙන තණකොළ ..................................................................

(කනවා, එනවා, පායනවා, කනවා, ලියනවා, පියාඹනවා, යනවා,

පාවෙනවා, පායනවා, සෙලවෙනවා)

| **කවුරුන් හෝ කරන වැඩ** | **ඉබේ සිදුවන ක්‍රියා** |
|---|---|
| බුරනවා | පාවෙනවා |
| ගයනවා | පිපෙනවා |
| කනවා | බැස යනවා |
| අඬනවා | හමනවා |
| සෝදනවා | කළුවර වෙනවා |
| බොනවා | ගලනවා |

## ලිඛිත ව්‍යවහාරයෙන් වාක්‍ය ලිවීම.

**මම** කිව්වොත් **මි** කියන්න.
**අපි** කිව්වොත් **මු** කියන්න.

**මම** බත් **කමි.**
**අපි** බත් **කමු.**

- **දුවේ, පුතේ, පහත වාක්‍ය සම්පූර්ණ කරමු.**

1. මම පොත් පාඩම් .......................................
2. අපි පොත් පාඩම් .......................................
3. මම පාසලට .......................................
4. අපි පාසලට .......................................

5. මම අකුරු ......................................

6. අපි අකුරු ......................................

7. මම බුදුන් ......................................

8. අපි බුදුන් ......................................

9. මම ගෙදර ......................................

10. අපි ගෙදර ......................................

---

**W 10 සම්මත භාෂා ව්‍යවාහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි.**

## ප්‍රාණවාචී - අප්‍රාණවාචී නාම පද

පණ ඇති පුද්ගල නාම හා සත්ත්ව නාම ප්‍රාණවාචී නාම පදවලට අයත් වන අතර, ස්ථාන නාම හා ද්‍රව්‍ය නාම අප්‍රාණවාචී නාම පද වලට අයත් වේ.

| ප්‍රාණවාචී නාම පද | | අප්‍රාණවාචී නාම පද | |
|---|---|---|---|
| අම්මා | මයිනා | පොත | මල |
| තාත්තා | නයා | මේසය | බෝතලය |
| අයියා | ඉබ්බා | පුටුව | කුඩය |
| මාමා | කිඹුලා | ගස | කරත්තය |
| නැන්දා | කුහුඹුවා | වැල | අඩි කෝදුව |

➤ දුවේ, පුතේ ප්‍රාණවාචී අප්‍රාණවාචී නාම පද වෙන්කර ලියමු.

ඉත්තෑවා පුතා
වත්ත දුව පාසල
නැව යහළුවා
වලසා
කළුලෑල්ල පැන්සල
පන්සල සිංහයා
පෑන

ප්‍රාණවාචී නාම පද

අප්‍රාණවාචී නාම පද

## ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද

| **පුරුෂ ලිංග නාම පද** | **ස්ත්‍රී ලිංග නාම පද** |
|---|---|
| තාත්තා<br>සොරා<br>ගුරුතුමා<br>ගිරවා<br>මල්ලි | අම්මා<br>සෙර<br>ගුරුතුමිය<br>ගිරවි<br>නංගී |

➤ කොටුවේ තිබෙන වචන වෙන්කර ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| බිසව | අක්කා | | නරියා | මාමා | කිකිළිය |
| ගුරුතුමා | මිතුරිය | දැරිය | නැන්දා | කුමරිය | නංගී |
| පුතා | සිංහයා | මුවදෙන | දුව නයා | | විදුහල්පතිනිය |
| දුව රජතුමා | මුවා | | අයියා | කුමාරයා | ශිෂ්‍යයා සිංහ |
| ධේනුව | ශිෂ්‍යයාව | විදුහල්පතිතුමා | | | |

පුරුෂ ලිංග නාම පද

ස්ත්‍රී ලිංග නාම පද

➤ දුවේ පුතේ කොටුව තුළ ඇති වචන දෙකෙන් සුදුසු වචනය ලියා හිස්තැන් පුරවමු.

1. ................................... ගසකට නැගී හඬලයි.
2. ................................... පැටවුන්ට කෑම සොයා දෙයි.

   (කිකිළිය / කුකුළා)
3. ................................... හඬට බුරයි.
4. ................................... පැටවුන්ට කිරි දෙයි.

   (බැල්ලි / බල්ලා)
5. ................................... කළු ලෑල්ලේ චිත්‍රයක් අඳි යි.
6. ................................... ඔසරිය ඇඳ සිටියි.

   ( ගුරුතුමිය / ගුරුතුමා)
7. ................................... ගස් සෙවනක නිදා සිටියි.

8. ................................... පැටවුන් සුරතල් කරයි.

(සිංහ ධේනුව / සිංහයා )

9. ................................... වෙළෙඳපොළට යයි.

10. ................................... ඇඳුම් සෝදයි.

(තාත්තා / අම්මා)

➤ පහත දී ඇති පුරුෂ ලිංග පදවලට ස්ත්‍රී ලිංග පද වරහන් තුළින් තෝරා ලියමු.

1. මොනරා - ...............................
2. කුමාරයා - ...............................
3. තරුණයා - ...............................
4. පුතා - ...............................
5. මුවා - ...............................
6. ගායකයා - ...............................

(කුමාරිය, ගායිකාව, සෙබඩ, මුවදෙන, දුව, තරුණිය)

## ඒක වචන හා බහු වචන නාම පද

- එකක් පිළිබඳව කියැවෙන පද ඒක වචන නාම පද වන අතර එකකට වැඩි සංඛ්‍යාවක් පිළිබඳ කියැවෙන නාම පද බහු වචන ලෙසට හැඳින්වේ.

| **ඒක වචන** | **බහු වචන** |
|---|---|
| ගස | ගස් |
| අත | අත් |
| පුටුව | පුටු |
| ගෙදර | ගෙවල් |

මල

පාඩම ගම

රට රටවල් මල්

ගස ළමයා අත අත්

පාසල් පුටුව පොත

පැන්සල පෑන් පැන්සල්

පෑන

➢ දුවේ, පුතේ ඉහත රවුම තුළ ඇති වචන යොදා වගුව පුරවමු.

| ඒක වචන නාම පද | බහු වචන නාම පද |
| --- | --- |
| | |

**නිපුණතාව W 10 :- මූර්ධජ, දන්තජ, තාලුජ වචන ලියමු කියවමු.**

බලා ලියමු දුවේ, පුතේ

**දන්තජ ''ස''**

ස ස ස ස ස ස

**මූර්ධජ ''ෂ''**

ෂ ෂ ෂ ෂ ෂ ෂ

**තාලුජ ''ශ''**

ශ ශ ශ ශ ශ ශ

➤ දුවේ, පුතේ පහත කොටුවේ ඇති වචන වෙන්කර ලියමු.

| | | | | |
|---|---|---|---|---|
| නිදර්ශන | අත්සන | ස්නානය | ලක්ෂණ | හසුන |
| වස්සානය | දේශන | නිරීක්ෂණය | | |
| ප්‍රකාශනය | පෝෂණ | මූලාසන | උෂ්ණ | |
| අවශ්‍ය | | | | |

**මූර්ධජ, තාලුජ, දන්තජ වචන ලියමු**

**දන්තජ ''ස''**

**තාලුජ ''ශ''**

## මූර්ධජ "ෂ"

➤ දුවේ, පුතේ හිස්තැන් පුරවමු.

1. පෝ ......... ණය (ෂ/ශ)
2. ආ ......... නය (ස/ශ)
3. දේ ......... නය (ෂ/ශ)
4. පා .......... ණ (ශා/ෂා)
5. ප්‍රදර් .......... න (ස/ශ)
6. අත් .......... න (ෂ/ශ/ස)
7. මූලා ......... නය (ශ/ස)
8. ප්‍ර .......... නය (ෂ්/ශ්)
9. උ ......... ණ (ෂ්/ශ්)
10. විශේ .......... ණ (ශ/ෂ)

**නිපුණතාව W 10 නාමපද හඳුනා ගනිමු.**

සතුන් පිළිබඳ නාම පද ⟶ **සත්ත්ව නාම** වේ.

පුද්ගලයන් කියවෙන පද ⟶ **පුද්ගල නාම** වේ.

ද්‍රව්‍ය ගැන කියවෙන පද ⟶ **ද්‍රව්‍ය නාම** වේ.

ස්ථාන ගැන කියවෙන පද ⟶ **ස්ථාන නාම** වේ.

**නාම පද**

| **සත්ත්ව නාම** | **පුද්ගල නාම** | **ද්‍රව්‍ය නාම** | **ස්ථාන නාම** |
|---|---|---|---|
| • ගිරවා | • මාමා | • පැන්සල | • ගෙදර |
| • තාරාවා | • තරුණී | • ගස්ලබු | • ඉඩම |
| • ඉස්සා | • වෛද්‍යවරායා | • ලිපප | • පාසල |

| | | | | |
|---|---|---|---|---|
| ගිරවා | පසිඳු | පාසල | ඉෂාණි | |
| රෝගය | ළිඳ | අනුරාධපුර | ඉඩම | අම්මා |
| බිනුරි | අශ්වයා | වෙළෙඳ පොළ | මාමා | |
| තරාදිය | ළහිරු | ඉණිමඟ | මකනය | බත්කූරා |
| පළඟැටියා | උකුස්සා | මහරගම | | |

- දුවේ,පුතේ ඉහත නාම පද වෙන් කර ලියමු.

